සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

උපදෙස් :

(i) සියලු ම අයදුම් කරුවන් පළමු කොටසේ ප්‍රශ්න 30 වම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව **II** උඩරට නර්තනය **III** පහතරට නර්තනය **IV** සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පිළිතුරු සැපයිය යුතුය.

(ii) ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති (1) (2) (3) (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කරන්න.

---

(01) නර්තන සම්ප්‍රදායන්ට අදාල නියමිත අංගහාර හඳුනා ගනු ලබන්නේ ............................................. මඟිනි.
(1) වන්නම් නර්තනය (2) සරඹ අභ්‍යාස
(3) චලන ඉදිරිපත් කිරීම (4) ත්‍රිවිධ ලය

(02) "රනේ රුවසේ වත රුවින් දිලේදෝ" මෙම කවි පද කොටස ............................................. කවි ගායනාවන්ට අයත් වේ.
(1) රබන් (2) පන්තේරු
(3) මෝල්ගස් (4) චාමර

(03) රස නිශ්පත්තියට අනුව "කරුණා" රසයෙන් උපදින භාවය ............................................. වේ,
(1) ශෝක (2) ශාන්ත (3) හාස්‍ය (4) පිළිකුල්

(04) "ලී මල්ලිය" සහිත ද්‍රවිඩ ගැමි නැටුම ............................................. නම් වේ.
(1) කෝලාට්ටම් (2) ලී කෙළි
(3) සුලකු (4) පින්නල් කෝලාට්ටම්

(05) ඇඹීම හා නෙළීම නර්තන කලාවේ මෙන්ම ............................................. කලාවේදි දක්නට ලැබේ
(1) චිත්‍ර (2) සැරසිලි (3) කැටයම් (4) නාට්‍ය

(06) ඝන වාද්‍ය භාණ්ඩයක් ලෙස ............................................. හැඳින් වේ.
(1) රබාන (2) පන්තේරුව (3) දවුල (4) කොම්බුව

(07) ශාන්ති කර්ම වල එන අටමඟලේ කවි ............................................. නැටුම් සඳහා යොදා ගනී.
(1) මෝල්ගස් (2) කඩු (3) ප්‍රශස්ති (4) ග්‍රහපංති

(08) මානසික ස්වස්ථාව කෙරෙහි බලපාන පාරිසරික සාධක .............................................කි,
(1) 4 (2) 3 (3) 5 (4) 12

(09) ''ශාන්ති කර්ම හා සිංහල සමාජය'' .................................................... ගේ කෘතියකි,

(1) මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ (2) මහාචාර්ය තිස්ස කාරියවසම්

(3) මහාචාර්ය මුදියන්සේ දිසානායක (4) ආචාර්ය ශ්‍රීයානි රාජපක්ෂ

(10) රජයේ ලලිත කලායතනය ආරම්භ වූයේ වර්ෂ.................................................... දීය.

(1) 1956 (2) 1934 (3) 1958 (4) 1952

(11) 

රූප සටහනින් දක්වෙන චරිතය .................................. ය,

(1) කෝලම් නාටකයේ මුදලි

(2) සොකරි නාටකයේ ආඩිගුරු

(3) කෝලම් නාටකයේ හේවා කෝලම

(4) සොකරි ගැමි නාටකයේ වෙද රාල

(12) වේදිකා උපකරණ, සැරසිලි අයත් වන්නේ .................................................... අභිනයට ය,

(1) ආංගික (2) වාචික (3) ආහාර්ය (4) සාත්වික

(13) මාත්‍රා 2+2+3 හඳුන්වනු ලබන්නේ, .................................................... නමිනි,

(1) දෙසුළු මැදුම් තුන්තිත (2) දෙසුළු මහ තුන්තිත

(3) දෙමැදුම් මහ තුන්තිත (4) දෙසුළු මැදුම් දෙතිත

(14) දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් 500ක් ගී ගයා නැටූබව .................................................... ගේ වාර්තාවේ දක්වේ,

(1) රොබට් නොක්ස් (2) ස්පිල් බර්ජන්

(3) පාහියන් භික්ෂුව (4) ඉබන් බතූතා

(15) පුද්ගලයකුගේ බාහිර ස්වරූපය එම අයුරින්ම ඉදිරිපත් කරනුයේ .................................................... අංග රචනයේ දී ය.

(1) විකාර රූපී (2) සාත්වික (3) ශෛලිගත (4) චරිතාංග

(16) ''තහලම් තල බෙර තම්මැට පට තන්තිරි ඩමරු'' යන කවි පදය .................................................... සංදේශයට අයත් වේ.

(1) තිසර (2) සැවුල් (3) සැළලිහිණි (4) පරෙවි

(17) සැළලිහිණිය, තිත්ත බත, පරෙවිය යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ .................................................... විසිනි.

(1) වජිරා චිත්‍රසේන මහත්මිය (2) එස්. පණීභාරත මහතා

(3) වසන්ත කුමාර මහතා (4) ප්‍රේමකුමාර එපිටවල මහතා

(18) නර්තන කලාවේ අධ්‍යාපනික වශයෙන් නූතන ප්‍රවනතාවක් ලෙස රජයේ පාසල් වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වූයේ .................................................... දීය.

(1) 1956 (2) 1978 (3) 1972 (4) 2005

- ප්‍රශ්න අංක 19 සිට 22 දක්වා පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | වජිරා චිත්‍රසේන | කමත | සොකරි |
| 2 | වෙස් අත්ත | තානායම් පොළ | මිරැන්ඩා හේමලතා |
| 3 | ලෙංචිනා | චන්ද්‍රලේඛා පෙරේරා | පුරන්සිනා |
| 4 | ලලිතා සරච්චන්ද්‍ර | නේපත්‍යාගාරය | කාලිඅම්මා |

(19) "සිසී" ගේ චරිතයට සම්බන්ධ ප්‍රවීන නර්තන ශිල්පිණිය දක්වෙනුයේ,

(1) 2 පේළියේ C තීරුවේය (2) 1 පේළියේ A තීරුවේය
(3) 3 පේළියේ B තීරුවේය (4) 4 පේළියේ A තීරුවේය

(20) කෝළම් ගැමි නාටකයේ කාන්තා චරිත සඳහන් වනුයේ,

(1) 3 පේළියේ A හා C තීරුවලය (2) 1 පේළියේ C තීරුවේය
(3) 1 පේළියේ C හා 4 පේළියේ C තීරුවේය (4) 4 පේළියේ A හා C තීරුවේය

(21) "අඳුන් ගාන්නි නෙත්දෙක ඔමරි කරන්නී" මෙම කවි පදයට අයත් චරිතය ඇත්තේ,

(1) 3පේළියේ A තීරුවේය (2) 2 පේළියේ B තීරුවේය
(3) 1 පේළියේ B තීරුවේය (4) 1 පේළියේ C තීරුවේය

(22) සොකරි ගැමි නාටකයට අයත් "රංග භූමිය" හැඳින්වෙන්නේ,

(1) 2 පේළියේ A තීරුවේය (2) 2 පේළියේ B තීරුවේය
(3) 1 පේළියේ B තීරුවේය (4) 4 පේළියේ B තීරුවේය

(23) රජ වාසලේ දී ලී කෙළි නර්තනයක ස්වරූපයෙන් නර්තනයේ යෙදුණු බව විද්‍යාමාන වන ගීත කොටසකි,

(1) දිනිදා උදය ගිරි මුදුනින්..... (2) වාසනා දිනේකි මේක පාමුතුටින්......
(3) විජයතුමා තම්මැන්නේ...... (4) මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ.....

(24) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ ප්‍රථම මුද්‍රා නාට්‍ය ලෙස සැලකෙන්නේ,

(1) ශාප්මෝචන්ය (2) කරදිය ය (3) ගීත ගෝවින්දය (4) සිතාහරණය

A



B

(25) ඉහත A හා B රූප සටහනෙහි වාද්‍ය භාණ්ඩ දෙක පිළිවෙළින්,

(1) පුං - මද්දල වේ (2) කෝල්බෙරය - චෙන්ඩාව වේ
(3) එඩැක්ක - චෙංගිලම් වේ (4) පෙනා - කුම්භ වේ

(26) A රූප සටහනට අයත් නර්තන සම්ප්‍රදායේ පසුබිම් සංගීතය නම්,

(1) උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතයයි

(2) දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතයයි.

(3) උත්තර භාරතීය රාගධාරී සංගීතයයි

(4) දක්ෂිණ භාරතීය හින්දුස්ථානි සංගීතයයි

(27) පිළිවෙළින් පහතරට, උඩරට, සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් රංග වස්ත්‍රාභරණ කට්ටල වේ,

(1) වෙස් ඇඳුම් කට්ටලය - තෙල්මේ ඇඳුම් කට්ටලය - පබළු ඇඳුම් කට්ටලය

(2) දෙවොල් ඇඳුම් කට්ටලය - වෙස් ඇඳුම් කට්ටලය - පබළු ඇඳුම් කට්ටලය

(3) පබළු ඇඳුම් කට්ටලය - වෙස් ඇඳුම් කට්ටලය - දෙවොල් ඇඳුම් කට්ටලය

(4) ලිච්ඡවි ඇඳුම් කට්ටලය - දෙවොල් ඇඳුම් කට්ටලය - වෙස් ඇඳුම් කට්ටලය

(28) කවිකාර මඩුවේදී රජුගේ ගුණ වර්ණනා කරනු ලැබුවේ ,

(1) අධිකාරි මුහන්දිරම්ය
(2) සබේ විදානේය

(3) ඉලංගම් මුහන්දිරම්ය
(4) වන්දිභට්ටයින්ය

(29) ශාන්ති කර්මයන්හි දක්නට ලැබෙන පොදු වාදන අංගයකි,

(1) අත්‍යාබෙර
(2) වට්ටම් පද

(3) මඟුල් බෙර
(4) අණබෙර

(30) නර්තන විෂය හැදෑරීමෙන්,

(1) රූපවාහිනී වැඩසටහන් සඳහා ඉදිරිපත් විය හැක.

(2) කායික, මානසික සමබර පෞරුෂයක් ඇති පුද්ගලයකු බිහි වේ.

(3) ගීත අනුව නර්තන කිරීමේ හැකියාව ලැබේ.

(4) විවිධ තරඟ සඳහා ඉදිරිපත් වීමට හැකියාව ලැබේ.

## II කොටස - උඩරට නර්තනය

(31) 12 වැනි ගොඩ සරඹයට අයත් කස්තිරමේ මුල්පද කොටස වේ.

(1) තත් තත් තක්කඩ කඩතක......
(2) තකට තකට තක තරිකිට.....

(2) තක් කඩතක ජිජිකුඳ........
(4) තත් කඩතක තත් තත් කඩතක.......

(32) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් සතර බීජාක්ෂර පිළිවෙලින් මෙසේය,

(1) ත, දි, තො ,න
(2) තත්, ජිත්, තොං, නං

(3) තත්, දිත්, තොං, නං
(4) ත, ජි, තොං, නංකඩ

(33) "දොං දොං ජිං ජිං ගජිගත" මෙම බෙර පදය අයත් වන්නේ මාත්‍රා

(1) 3+4 දෙතිතටය.
(2) 4+4 තනි තිතටය.

(3) 2+4 දෙතිතටය.
(4) 2+3 දෙතිතටය.

(34) "ගසමින් කග පතින් දෙපලුව අසුර සෙන්" මෙම කවිය ඇතුලත් වන වන්නම වන්නේ,

(1) මුසලඩි වන්නම ය.
(2) සැවුලා වන්නම ය.

(3) තුරඟා වන්නම ය.
(4) සිංහරාජ වන්නම ය.

(35) කොහොඹා කංකාරියේ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා වන්නේ,
(1) ගුරුගේ මාලාව, යක්කම් පහ.
(2) අඹ විදමන, යක්කම් පහ.
(3) අසුර යක්කම, ගුරුගේ මාලාව.
(4) ගබඩා කොල්ලය, රාමා මැරීම.

(36) "කුදාංත ගත දොං" වට්ටමේ තිත මෙසේය,
(1) 2+4+4 තුන් තිතය
(2) 3+3+4 තුන් තිතය
(3) 2+2+4 තුන් තිතය
(4) 2+3+4 තුන් තිතය

(37) කොහොඹා කංකාරිය ශාන්ති කර්මයට ආවේණික සියළු තොරතුරු ඇතුලත් ග්‍රන්ථය ලෙස නම් කල හැකිය,
(1) කොහොඹායක් කංකාරිය සහ සමාජය
(2) සිංහල නර්තන කලාව
(3) කොහොඹායක් කංකාරිය
(4) ශාන්ති කර්ම සහ සිංහල සමාජය

(38) උඩරට වන්නම් ප්‍රථමයෙන් ප්‍රබන්ධ කර ඇත්තේ,
(1) ජේ.ඊ.සේදරමන් මහතා ය.
(2) රම්මොලවක අධිකාරම් තුමාය.
(3) සී.ද.එස්. කුලතිලක මහතාය.
(4) කිරි ඇල්ලේ ඥාණවිමල හිමිය.

(39) අයිලේ යැදීම, නානුමුර කිරීම, හඟල යැදීම මෙම චාරිත්‍ර විධි,
(1) ශාන්ති කර්ම සියල්ලේම දක්නට ඇත.
(2) දෙවොල්මඩු ශාන්ති කර්මයේ දක්නට ඇත.
(3) කොහොඹා කංකාරී ශාන්ති කර්මයේ දක්නට ඇත.
(4) නර්තන සම්ප්‍රදායන් සියල්ලේම දක්නට ඇත.

(40) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රගමනයට දායක වූ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,
(1) එස්.පණීභාරත මයා
(2) විල්සන් ඔලබොඩුව මයා
(3) රද්දැල්ලේ පොඩි මහත්මයා මයා.
(4) ජේ.ඊ. සේදරමන් මයා

## III කොටස - පහතරට නර්තනය

(31) 12 වැනි ඉලංගම් සරඹයට අයත් ඉරට්ටියේ මුල්පද කොටස වේ.
(1) ගුදිත ගදිත ගත ගත් දැහිං....
(2) ගුදිත ගුම් දැහිං දිකගත...
(2) ගුහිති ගදිරිකිට ගුද ගුද...
(4) රිම්ගත ගුඳගත් දැහිං....

(32) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් සතර බීජාක්ෂර පිළිවෙලින් මෙසේය,
(1) තත්,ජිත්,තොං,නං
(2) තත්,දිත්,තොං,නං
(3) තත්,දිම්,තොං,නං
(4) තත්, ගුම්, තොං, නං

(33) "දොම් තම් ගත ගදිතම් ගත" මෙම බෙර පදය අයත් වන්නේ මාත්‍රා
(1) 3+4 දෙතිතටය.
(2) 4+4 තනි තිතටය.
(3) 2+4 දෙතිතටය.
(4) 2+3 දෙතිතටය.

(34) ''සඳ සන්දර දිගු පුන්ගිරි දිළිමන්'' මෙම කවිය ඇතුලත් වන සිංදු වන්නම වන්නේ,

(1) ශුද්ධාතාලය සිංදු වන්නමය. (2) නාතිලිංචිතාලය සිංදු වන්නමය.

(3) භාවාදී තාලය සිංදු වන්නමය. (4) ලලිතරාග තාලය සිංදු වන්නමය.

(35) දෙවොල්මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා වන්නේ,

(1) දෙවොල්ගොඩ බැසීම, අඹ විදමන (2) අඹ විදමන, යක්කම් පහ

(3) දෙවොල් ගොඩ බැසීම, ගුරුගේ මාලාව (4) ගබඩා කොල්ලය, අඹ විදමන

(36) ''ගුද ගති ගත'' වට්ටමේ තිත මෙසේය,

(1) 2+2+4 තුන් තිතය (2) 4+4 තනි තිතය

(3) 2+2 තනි තිතය (4) 2+2+3 තුන් තිතය

(37) ශාන්ති කර්ම වල දක්නට ලැබෙන රංග ශෛලින් විස්තරාත්මකව දක්වා ඇති ග්‍රන්ථය ලෙස නම් කල හැකිය,

(1) පහතරට ශාන්ති කර්ම සාහිත්‍යය (2) ශාන්ති කර්ම හා සිංහල සමාජය

(3) සිංහල නර්තන කලාව (4) රටයකුම ඉහවත් රිද්දියාගය

(38) පහතරට සිංදු වන්නම් ප්‍රථමයෙන් ප්‍රබන්ධ කර ඇත්තේ,

(1) ජේ.ඊ.සේදරමන් මහතා ය. (2) බරණ ගණිතයා ය.

(3) රම්මොලවක අධිකාරම්තුමා ය. (4) ගණිතාලංකාර බමුණාය.

(39) බිසෝකප සිටුවීම, පත්තිනි නැටීම, මඩුපේ කිරීම, මෙම චාරිත්‍ර විධි,

(1) ශාන්ති කර්ම සියල්ලේම දක්නට ඇත.

(2) කොහොඹා කංකාරියේ දක්නට ඇත.

(3) දෙවොල්මඩු ශාන්ති කර්මයේ දක්නට ඇත.

(4) නර්තන සම්ප්‍රදායන් සියල්ලේම දක්නට ඇත.

(40) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රගමනයට දායක වූ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,

(1) කේ.එස්. ප්‍රනාන්දු මයා. (2) එස්.පණිභාරත මයා.

(3) ජේ.ඊ. සේදරමන් මයා. (4) චිත්‍රසේන ඩියස් මහතාය.

## IV කොටස - සබරගමු නර්තනය

(31) 12 වැනි දොඹින පදයට අයත් කස්තිරමේ මුල්පද කොටස වේ.

(1) තරිකිට දිරිකිට දිරිකිට තරිකිට දිරිකුං තරිකුං

(2) කිත් තා කිත් තා ජෙජ් ජෙං තා

(3) කර තක් තක්කිට කරතක තරිකිට

(4) තෙයියත් තා දොං

(32) සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් සතර බීජාක්ෂර පිළිවෙලින් මෙසේය,

(1) තත්,දිත්,තොං,නං (2) තත්,ජිත්,තොං,නං

(3) දිත්, ජෙං, තොං, නං (4) තා, දිමි, තොං, නම්

(33) ''කුඳත් තක්කිට තකට ජිංතක'' මෙම බෙර පදය අයත් වන්නේ මාත්‍රා

(1) 3+3 තනි තිතටය. (2) 2+4 දෙතිතටය.
(3) 3+4 දෙතිතටය. (4) 2+3 දෙතිතටය.

(34) ''රුව සමනා උණත් මනා - ඉසි වඩනා රිටු නොමිනා'' මෙම කවිය ඇතුලත් වන වන්නම වන්නේ,

(1) මණ්ඩුක වන්නමය. (2) කොවුලා වන්නමය.
(3) සැවුලා වන්නමය. (4) අනිලා වන්නමය.

(35) පහන් මඩුව ශාන්ති කර්මයේ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා වන්නේ,

(1) අසුර යක්කම, රාමා මැරීම (2) රාමා මැරීම, ගබඩා කොල්ලය
(3) ගබඩා කොල්ලය, අඹ විදමන (4) අඹ විදමන, යක්කම් පහ

(36) පට්ටුතාල මාත්‍රයට අදාල තිත මෙසේය,

(1) 2+2+4 තුන් තිතය (2) 2+2+3 තුන් තිතය
(3) 3+2+2 තුන් තිතය (4) 3+3+4 තුන් තිතය

(37) පෙරහැර මංගල්‍ය පිළිබඳ තොරතුරු, සමන් දෙවියන් පිළිබඳ මතවාද සාධක, සහිතව ඇතුලත් ග්‍රන්ථය.

(1) සමන් දේවාල පුද සිරිත්. (2) සබරගමු නර්තන කලාව.
(3) සිංහල නර්තන කලාව. (4) ශාන්ති කර්ම හා සමාජය.

(38) පැරණි සබරගමු වන්නම් පෙළක් පුස්කොළ පොතක් ආශ්‍රයෙන් සංස්කරණය කර ඇත්තේ,

(1) ජේ.ඊ.දෙල්ගොඩ මහතාය (2) ධර්මාලංකාර අතපත්තුමුදලිය
(3) ඩී.ඩී. යාහින්න මහතාය (4) මහවල තැන්න මුදලිය

(39) තොටපේ කිරීම, දළුමුර පිදීම, පහන් දැල්වීම මෙම චාරිත්‍ර විධි,

(1) ශාන්ති කර්ම සියල්ලේම දක්නට ඇත.
(2) දෙවොල්මඩු ශාන්ති කර්මයේ දක්නට ඇත.
(3) පහන් මඩු ශාන්ති කර්මයේ දක්නට ඇත.
(4) නර්තන සම්ප්‍රදායන් සියල්ලේම දක්නට ඇත.

(40) සබරගමු නර්තනයේ ප්‍රගමනයට දායක වූ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,

(1) ගලුකාගම හීන් නිලමේ මහතා (2) වීල්සන් ඔලබොඩුව මයා
(3) අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා (4) කේ.එස්. ප්‍රනාන්දු මහතා

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) (1) "ශාන්ත" නමැති ස්ථායි භාවයෙන් උපදින රසය .......................... රසයයි.

(2) "කදුරුගසක් ගෙන නියමෙට මේ ලෙස ගැනපන්" කවි පාදයට අදාල ගැමි නැටුම .......................... නැටුමයි.

(3) රට යකුම හෙවත් රිද්දි යාගය කෘතිය රචනා කරන ලද්දේ මහාචාර්ය .......................... විසිනි.

(4) මිනිස් චරිත හා අති මානුෂ චරිත .......................... වලදී යොදා ගනු ලැබේ.

(5) රබීන්ද්‍රනාත් තාගොර් තුමාගේ පැමිණීම සිදු වූයේ .......................... වර්ෂයේදීය.

(6) "පාලමොට්ටායි" සෙල් ලිපිය අයත් වන්නේ .......................... යුගයටය.

(7) රන් කිකිලි, හපනා ළමා මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ .......................... විසිනි.

(8) රජවරුන්ගේ හා දෙවිවරුන්ගේ ගුණ වර්ණනා ඇතුලත්ව නිර්මාණය වී ඇත්තේ .......................... කාව්‍යයි.

(9) පහත සඳහන් ද්‍රවිඩ ගැමි නැටුම් වලට අදාල සිංහල ගැමි නැටුම් නම් කරන්න.
සුළකු ..........................
කෝලාට්ටම් ..........................

(10) පහත දැක්වෙන රංග වස්ත්‍රාභරණ අයත්වන විදේශීය නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.
කිරීටම් ..........................
රිෂම් පුරිට් ..........................

(ලකුණු 01 x 12 = 12)

(02) (1) මාත්‍රා 3 + 4 දෙතිතට අයත් බෙරපදයක්/ දවුල් පදයක් ප්‍රස්තාර ගත කරන්න.

(2) "යුද්දෙටත් ඇවිත් සිඟු පිට නැව් නැඟලා පරංගි
උන්න මුත් ඇවිත් කොළඹට ගොඩ බැහැලා" මෙම කවි පද දෙක මාත්‍රා 3+3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

(3) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් කස්තිරමක් / ඉරට්ටියක් / කලාසමක් ප්‍රස්තාර ගත කරන්න.

(03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(1) පන්තේරු කවි
(2) ආචාර්ය මිරන්ඩා හේමලතා මහත්මිය
(3) දෙවොල් බෙරය
(4) ද්‍රවිඩ ගැමි නැටුම්
(5) නර්තන කලාව හා සබැඳි චිත්‍ර කලාව

(04) කොහොඹාකංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව ප්‍රධාන ශාන්ති කර්ම ලෙස හැඳින්වේ,

(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු හතරක් ලියන්න.

(2) ශාන්ති කර්ම දෙකක පූර්ව චාරිත්‍ර දෙක බැගින් ගෙන එහි සමානතා පිළිබඳව විස්තර කරන්න.

(3) එක් ශාන්ති කර්මයක අන්තර්ගත වාදන අවස්ථා දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(05) (1) සොකරි හා කෝලම් නාටක පවතින ප්‍රදේශ දෙක බැගින් නම් කරන්න.

(2) සොකරි නාටකයේ දැකිය හැකි රංග භාණ්ඩ පිළිබඳ විස්තරයක් කරන්න.

(3) කෝලම් නාටකවලට අදාල චරිතයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(06) (1) නර්තන කලාව හැදෑරීම තුලින් සිදුවන මානසික ස්වස්ථතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

(2) නර්තන කලාව හැදෑරීම තුලින් අත්පත් කර ගත හැකි සමාජයීය වටිනාකම් 4ක් පිළිබඳ විග්‍රහ කරන්න.

(3) රූපවාහිනී මාධ්‍ය තුළින් විකාශය වන නර්තන අංග නර්තන කලාවේ නූතන ප්‍රවණතා කෙරෙහි කොතෙක් දුරට බලපා ඇද්දැයි විමසන්න.

(07)



A



B



C

(1) A හා B රූපවල දැක්වෙන වාද්‍ය භාණ්ඩ නම්කර ඊට අදාළ නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(2) C රූපයේ දැක්වෙන දේශීය මුද්‍රානාට්‍යය නම්කර එහි විකාශය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(3) B රූපයට අදාල නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයක් නම්කර වාද්‍ය භාණ්ඩය පිළිබඳ විස්තරයක් කරන්න.